

**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
වෙත යොමු කරන ලද
2024 වර්ෂය සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව
2023 වර්ෂය සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව
2022 සහ 2024 වර්ෂ සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තා
සහ
2023 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව
සම්බන්ධයෙන්
රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ වාර්තාව
පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද්දේ
**රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපති**
**ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම. විසිනි**
**2025 ඔක්තෝබර් මස 23 වැනි බ්‍රහස්පතින්දා**

**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவுக்கு ஆற்றுப்படுத்தப்பட்ட**
2024 ஆம் ஆண்டுக்கான நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சின் செயலாற்றுகை அறிக்கை
2023 ஆம் ஆண்டுக்கான நீதி, சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சின் செயலாற்றுகை அறிக்கை
2022 மற்றும் 2024 ஆம் ஆண்டுகளுக்கான சட்டமா அதிபதி திணைக்களத்தின் செயலாற்றுகை அறிக்கைகள்
மற்றும்
2023 ஆம் ஆண்டுக்கான சட்ட வரைஞர் திணைக்களத்தின் வருடாந்த செயலாற்றுகை அறிக்கை
தொடர்பான
ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் அறிக்கையானது
**ஆளுகை, நீதி மற்றும் சிவில் பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழுவின் தவிசாளர்**
**கௌரவ (டாக்டர்) நஜீத் இந்திக்க, பா.உ அவர்களால்**
**பாராளுமன்றத்திற்குச் சமர்ப்பிக்கப்பட்டது.**
**2025 ஒக்தோபர் 23 ஆம் திகதி வியாழக்கிழமை**

Report of the
**Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection**
regarding the
Performance Report of the Ministry of Justice and National Integration for the year 2024
Performance Report of the Ministry of Justice, Prisons Affairs and Constitutional Reforms for the year 2023
Performance Reports of the Attorney General's Department for the years 2022 & 2024
and
Annual Performance Report of the Legal Draftsman's Department for the year 2023
referred to the
Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection
Presented to Parliament by
**The Hon. (Dr.) Najith Indika, M.P.**
**Chair of the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection**
**Thursday, 23 October 2025**

## කාරක සභාවේ වාර්තාව

2025 අගෝස්තු මස 19 වැනි දින පාර්ලිමේන්තුවේදී රැස් වූ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් පහත සඳහන් කාර්යසාධන වාර්තා සලකා බලන ලදී.

- **2024 වර්ෂය සඳහා අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව** (2025.07.23 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)

- **2023 වර්ෂය සඳහා අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ කාර්ය සාධන** වාර්තාව (2024.06.07 වැනි දින නවවැනි පාර්ලිමේන්තුවේ යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.05.02 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

- **2022 වර්ෂය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව** (2023.11.24 වැනි දින නවවැනි පාර්ලිමේන්තුවේ යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.05.02 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

- **2024 වර්ෂය සඳහා නීතිපති දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව** (2025.06.30 වැනි දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී)

- **2023 වර්ෂය සඳහා නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව** (2024.07.09 වැනි දින නවවැනි පාර්ලිමේන්තුවේ යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදුව, 2025.05.02 දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී ගනු ලැබූ තීරණය පරිදි දසවැනි පාර්ලිමේන්තුවේ රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලදී.)

**සහභාගී වූ කාරක සභික මන්ත්‍රීවරුන්**

ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා,පා.ම. (සභාපති)
ගරු ජනාධිපති නීතිඥ ෆයිසර් මුස්තාපා මහතා, පා.ම.
ගරු ජී.ජී. පොන්නම්බලම් මහතා, පා.ම.
ගරු එම්.කේ.එම්. අස්ලම් මහතා, පා.ම.
ගරු නීතිඥ තුෂාරි ජයසිංහ මහත්මිය, පා.ම.
ගරු (වෛද්‍ය) සෙල්ලතම්බි තිලකනාදන් මහතා, පා.ම.
ගරු ධර්මප්‍රිය විජේසිංහ මහතා, පා.ම.
ගරු චන්දන සූරියආරච්චි මහතා, පා.ම.

හංස අබේරත්න මහතා, සහකාර මහලේකම්, කාරක සභාවේ ලේකම්
චූලා හේරත් මහත්මිය, සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)

**සහභාගී වූ නිලධාරීන්**

**අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය**

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන මහත්මිය, ලේකම්
ආර්.පී.එස්. සමන්කුමාරි මහත්මිය, අතිරේක ලේකම් (පරිපාලන)
පියුමන්ති පීරිස් මහත්මිය, අතිරේක ලේකම් (නීති) සහ අනෙකුත් නිලධාරීන්

**නීතිපති දෙපාර්තමේන්තුව**

නිර්මලන් විග්නේෂ්වරන් මහතා, නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්
කණිෂ්ක රාජකරුණා මහතා, රජයේ නීතිඥ (පරිපාලන) සහ අනෙකුත් නිලධාරීන්

**නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව**

දිල්රුක්ෂි සමරවීර මහත්මිය, නීති කෙටුම්පත් සම්පාදක
ඒ.එම්.පී. නිලන්ති මහත්මිය, ප්‍රධාන ගණකාධිකාරී සහ අනෙකුත් නිලධාරීන්

උක්ත වාර්තා සියල්ල පිළිබඳව කාරක සභාවේදී සාකච්ඡා කරන ලද අතර, අදාළ ආයතනවල කාර්යක්ෂමතාවය හා ඵලදායිතාවය පිණිසත් සමස්ත මහජනතාවගේ යහපත උදෙසාත් එකී ආයතන කටයුතු කළ යුත්තේ කෙසේද යන්න පිළිබඳව අවශ්‍ය උපදෙස් හා නිර්දේශයන් කාරක සභාව විසින් ඉදිරිපත් කරන ලද අතර, එම වාර්තාවල සැලකිය යුතු දෝෂ නොතිබූ බැවින් ඒ පිළිබඳ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි කාරක සභාව විසින් තීරණය කරන ලදී.

**කාරක සභා තීරණ**

සලකා බැලීමෙන් අනතුරුව, රාජ්‍ය පාලනය, යුක්තිය සහ සිවිල් ආරක්ෂණය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව, පාර්ලිමේන්තුව විසින් කාරක සභාව වෙත යොමු කරන ලද යථෝක්ත කාර්යසාධන වාර්තාවන්ට එකඟ වූ අතර ඒ පිළිබඳව සකසන ලද මෙම වාර්තාව, කාරක සභාවේ සභාපති ගරු (වෛද්‍ය) නජිත් ඉන්දික මහතා, පා.ම. විසින් 2025 ඔක්තෝබර් මස 23 වැනි දින පාර්ලිමේන්තුවට පිළිගැන්වීමට තීරණය කරන ලදී.